දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :-22/2010

බ/12/02/අයවැය
මූල්‍ය අංශය,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2010.06.21

සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්,
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්,

## විවිධ සේවා සමුපකාර සමිති සතු ඉන්ධනහල් වලින් ණය පදනම මත ඉන්ධන ලබා ගැනීම

උක්ත කරුණ සම්බන්ධව භාණ්ඩාගාර ලේකම් ගේ 2010.05.22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF 443 ප්‍රකාරව පහත උපදෙස් අනුව කටයුතු කිරීමට ඔබගේ අවධානය අවධානය යොමුකර අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ දැන ගැනීම සඳහා මේ සමඟ අමුණා ඇත.

01. ඔබ ආයතනය සඳහා අවශ්‍ය ඉන්ධන ලබා ගැනීමේදී සමුපාකාර සමිති සතු ඉන්ධනහල් වලින් ලබා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. සමුපකාර සමිති සතු ඉන්ධනහල් බන්ධනාගාර ආයතනය ආසන්නයේ නොමැති නම් වෙනත් ඉන්ධන පිරවුම්හලකින් ඉන්ධන ලබා ගැනීමට කටයුතු කල හැක.

02. සමුපකාර සමිති මගින් ඇණවුම් මත ඉන්ධන ලබා ගෙන පසුව ගෙවීමේ ක්‍රමයට (ණය පදනම මත) ඉන්ධන ලබා ගැනීම වහාම නතර කල යුතුය. තැන්පත් මුදල් මත ඉන්ධන ලබා ගන්නේ නම් තැන්පත් මුදලේ ප්‍රමාණය නොඉක්මවීමට කටයුතු කල යුතුය. නොඑසේ නම් අත්පිට මුදල් ගෙවා ඉන්ධන ලබා ගැනීමට කටයුතු කල යුතුය.

03. ඉහත චක්‍රලේඛය අනුව සමුපාකාර සමිතිවලින් තැන්පත් මුදල් මත ඉන්ධන ලබා ගැනීමට කටයුතු කරන්නේ නම් මේ සමඟ අමුණා ඇති ආකෘතියේ විස්තර 2010.06.30 වන දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ලබා දීමට කටයුතු කල යුතුය.

මේජර් ජනරාල් වී.ආර්. සිල්වා
ආර්එස්පී, යූඑස්පී, එන්ඩියූ, අයිජ්.
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

# ඉන්ධන අත්තිකාරම් ලබා ගැනීම

බන්ධනාගාර ආයතනය :-..............................

| අනු අංකය | වාහන අංකය | වාහන වර්ගය (බස්,කාර්, ලොරි,ත්‍රීවීලර්,විදුලි ජනක,වතුර පොම්ප,ආදි.) | ඉන්ධන වර්ගය ඩීසල්/ පෙට්‍රල්/ භූමිතෙල් | ජනවාරි සිට මැයි දක්වා ඉන්ධන වියදම | අපේක්ෂිත තැන්පතු මුදලේ වටිනාකම | සමුපාකාර ආයතනයේ නම |
|---|---|---|---|---|---|---|
| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

සකස් කළේ :-

පරීක්ෂා කළේ :-

බන්ධනාගාර අධිකාරී/ සහකාර බන්ධනාගාර අධිකාරී